// # ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2466/15 – 2025 දෙසැම්බර් මස 10 වැනි බදාදා – 2025.12.10**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2020/63

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2025.04.04 දිනැති හා අංක 2430/36 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2025.03.25 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පන්නිපිටිය, ඇරව්වල, සුහසාධක මාවත, අංක 576/3 ලිපිනයෙහි පදිංචි ආර්. එම්. විජේරත්න මයා සහ කොළඹ 02, වොක්ෂෝල් වීදිය, අංක 21 ලිපිනයෙහි පිහිටි ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/24/2025 හා 2025.09.30 දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 නොවැම්බර් මස 17 වැනි දින.
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 045852 – 24 (2025/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ සහ කාර්මික අධිකරණ ශාඛාවේ දී ය.

යොමු අංකය : IR/COM/03/2020/63
නඩු අංකය : A/24/2025

ආර්. එම්. විජේරත්න මහතා,
අංක 576/3,
සුභසාධක මාවත,
පන්නිපිටිය.

*පළමු පාර්ශ්වය*

*සහ*

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්,
අංක 21,
වොක්ෂෝල් විදිය,
කොළඹ 02.

*දෙවන පාර්ශ්වය*

අතර පවතින කාර්මික ආරාවුල

**බලතල පැවරීම**

කම්කරු ආමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු මහතාට 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2025 මාර්තු 25 වන දිනැති නියෝගයෙන් හෙට්ටි රත්නායක ලියනගේ සුගතදාස වන මා පත්කොට මා වෙත යොමු කර ඇත.

**ආරාවුලට හේතු වූ කරුණු**

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හි රියදුරෙකු වශයෙන් සේවය කරන ආර්. එම්. විජේරත්න මහතාට 2015 වර්ෂයට පූර්ව කාලසීමාව තුළ දී අතිකාල ගණනය කරනු ලැබූ ක්‍රමවේදය 2015 වර්ෂයේ සිට සංශෝධනය කිරීම මගින් අසාධාරණයක් සිදු වී තිබේද යන්නත්, එසේ අසාධාරණයක් සිදු වී තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්නත් පිළිබඳ වේ.

අදාළ ආරාවුල බේරුම්කරණයෙන් නිරවුල් කිරීම සඳහා දෙපාර්ශ්වයට ම ආරාවුලට හේතු වී ඇති කරුණු පිළිබඳ සම්පූර්ණ විස්තර ඉදිරිපත් කරන ලෙසත් 2025.06.05 වන දින බේරුම්කරණ සහ කාර්මික අධිකරණ ශාඛාවේ එදින පෙ.ව.10.30 පෙනීසිටින ලෙස දන්වා ඇත.

එදින දෙපාර්ශ්වයටම පෙනීසිටීමක් හෝ නියමිත විස්තර ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට ද අපොහොසත් වී ඇත. මේ අතර පළමු පාර්ශ්වය වෙනුවෙන් ආර්. එම්. ඩී. ලක්මාලි විජේරත්න මහත්මිය තමා ආර්.එම්. විජේරත්න මහතාගේ දියණිය වන බවත් පියා හදිසි අනතුරකින් මිය ගිය බවත් තවදුරටත් මෙම ආරාවුල පවත්වාගෙන නොයාමට තීරණය කර ඇති බවත් සඳහන් කර ඇති අතර ඉදිරිපත් වූ සාක්ෂි අනුව ඔහු වෙත ලැබිය යුතු යම් දෙයක් වේ නම් එය ලබාදෙන ලෙස ඉල්ලා ඇත. (11 පිටුව) මරණ සහතිකය අමුණා ඇත.

2025.07.18 වන දින නඩුව කැඳවූ අවස්ථාවේ දෙවන පාර්ශ්වය වන ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් ආයතනයේ විධායක නිලධාරි (සේවක සබඳතා) නීතිඥ තරිඳු චතුරංග මහතා, විධායක නිලධාරී ශිවන්ති අබේසේකර මහත්මිය නීතිඥ තිවංක චන්ද්‍රසේන මහත්මිය සමග පෙනී සිටි. පළමු පාර්ශ්වය පෙනී සිටීමක් නැත. පළමු පාර්ශ්වය වූ ආර්.එම්.විජේරත්න මහතාගේ දියණිය කරන ලද ඉල්ලීම එනම් ඔහු වෙත ලැබිය යුතු යම් දෙයක් වේ නම් එය ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීම විවෘත අධිකරණයේ දී දෙවන පාර්ශ්වය වෙත දැනුවත් කළෙමි. ඒ සම්බන්ධයෙන් ආයතනයේ ස්ථාවරය 2025.08.07 දිනට ප්‍රථම ලිඛිතව ඉදිරිපත් කරන ලෙස දැන්වූ අතර නීතිඥ තිවංක චන්ද්‍රසේන මහත්මිය එය ලබා දීමට පොරොන්දු විය.

එම ලිඛිත දේශන (16 පිටුව) අනුව ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් ආයතනයේ රියදුරු වශයෙන් සේවය කරන ආර්. එම්. විජේරත්න මහතා 2017.09.07 දාතමින් අතිකාල ගෙවීම අක්‍රමිකතා පිළිබඳව දැනුම් දීම ශීර්ෂය යටතේ දකුණු කොළඹ කම්කරු කොමසාරිස් කාර්යාලය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර එය CS/COA/B/1/521/17 අංකය යටතේ විභාගයට ගන්නා ලද බවත් ඒ අතර ඔහු විසින් අතිකාල හා වාර්ෂික ප්‍රසාද හිඟ මුදල ගෙවීම පැහැරහැරීම ශීර්ෂය සමග නැවතත් දකුණු කොළඹ කම්කරු කාර්යාලයට පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබූ අතර එය CS/COA/B/1/521/17 යටතේ විභාගයට ගත් බවත් දන්වා ඇත.

දකුණු කොළඹ කම්කරු කාර්යාලයට පවත්වාගෙන ගිය ඉහත ගොනුව කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්මික සබඳතා අංශය මගින් IR/COM/03/2020/63 යටතේ පවත්වාගෙන යන අතර ආර්.එම්. විජේරත්න මහතා නමින් හිඟ අතිකාල මුදල් වශයෙන් රු. 38127.15 ක මුදලක් ගණනය කර දකුණු කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කරන ලෙස කම්කරු දෙපාර්තමේන්තුව විසින් දන්වා තිබූ බව ද එම නියෝගය මත රු 38127.15 ක මුදල 2023.01.09 වන දින දකුණු කොළඹ, සහකාර කම්කරු කොමසාරිස් නමින් මහජන බැංකුවේ නාරාහේන්පිට ශාඛාවේ තැන්පත් කළ බව සඳහන් කර ඇති අතර කම්කරු කොමසාරිස් ගේ නිර්දේශ මත අතිකාල මුදල් ගෙවා ඇති බව සඳහන් කර ඇත.

මෙම අතිකාල මුදල බේරුම්කරණය සඳහා යොමු කරන ලද ආරාවුලට අදාළ නොවන බව ගොනුව පරීක්ෂා කිරීමෙන් තහවුරු වේ. දෙවන පාර්ශ්වය ඉහත පැමිණිලි විභාගයේදී එම තොරතුරු ඉදිරිපත් කර නැත. මේ අනුව දෙවන පාර්ශ්වය ඉදිරිපත් කරන අතිකාල ගෙවීම් මෙම ආරාවුලට සම්බන්ධයක් නොමැත.

එමෙන්ම මෙම ලිඛිත දේශන මගින් පහත සඳහන් ඉල්ලීම් කර ඇත

01. පලමු පාර්ශ්වය මත R.M.විජේරත්න මිය යාම

02. 2024.02.01 සිට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් ආයතනය ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කොපරේෂන් ජෙනරල් ලිමිටඩ් වශයෙන් විභේදනය කිරීම.

යන කරුණ මත බේරුම්කරණ නඩුකරය පවත්වාගෙන යා නොහැකි බැවින් විභාගයට නොගෙන ඉවත ලන ලෙස ඉල්ලා ඇත.

ආරාවුලට හේතු වූ කරුණු ඉදිරිපත් කර නැත. කෙසේ වුවද පළමු පාර්ශ්වයට ආසාධාරණයක් සිදු වී තිබේද යන්න විමසා බැලීම සඳහා කාර්මික සබඳතා අංශය පවත්වාගෙන ගිය ගොනුව ගෙන්වා පරීක්ෂා කිරීමට තීරණය කළ අතර එම ගොනුව 2025.09.10 වන දින නිරීක්ෂණය කළෙමි.

ඉල්ලුම්කරු තම පැමිණිල්ල මගින් තමන් පිට පළාත්වල රාජකාරී ගමන් ගිය විට වර්ෂ 2015 ට පෙර පසුදින පෙ.ව. 3.00 දක්වා අතිකාල ගෙවූ බවත් වර්ෂ 2015 සිට එම ක්‍රමය වෙනස් කොට රාජකාරියට ගිය දින රාත්‍රි 10.00 දක්වා පමණක් අතිකාල ගණනය කළ බවත් එයින් තමන්ට ආසාධාරණයක් සිදු වී ඇති බවත් සඳහන් කර ඇත.

මෙම ප්‍රතිපත්තිමය තීරණය ඉල්ලුම්කරුට පමණක් කළ දෙයක් ද අනිකුත් රියදුරන්ට සහ කාර්යය මණ්ඩයට කරන ලද්දක්දැයි තොරතුරු සොයා ගත නොහැකිය. අනික් සේවකයන් ගෙන් එබඳු පැමිණිල්ලක් තිබූ බවට සඳහන් නොවේ. කම්කරු දෙපාර්තමේන්තුවේ නිර්දේශය මත ගෙවූ හිඟ අතිකාල මුදල මෙම ආරාවුලට හේතු වූ කරුණට අදාළ නොවන බව තහවුරු වේ. කාර්මික අධිකරණය වෙත යොමු කළ ගොනුවේ එවැනි ගණනය කිරීමක් පිළිබඳ සඳහනක් නොමැති අතර ආයතනය එම විභාග වන අවස්ථාවේ එවැනි ගෙවීමක් සඳහන් කර නැත.

මේ අනුව,

1. ඉල්ලුම්කරු මිය යෑම
2. උරුමකරුවන් මෙම ආරාවුල පවත්වාගෙන නොයාමට තීරණය කිරීම
3. ඉල්ලුම්කරුට පමණක් අසාධාරණයක් වූ බවට තොරතුරු නොලැබීම

යන කරුණු මත මෙම ආරාවුල නිෂ්ප්‍රභා කිරීමට තීරණය කළෙමි.
මෙම තීන්දුව සාධාරණ සහ යුක්තිසහගත තීරණයක් බව ප්‍රකාශ කරමි.

**එච්. ආර්. එල්. සුගතදාස,**
බේරුම්කරු.

2025 සැප්තැම්බර් මස 30 දින,

EOG 12 - 0046

---

මගේ අංකය: IR/COM/03/2019/331

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2022.11.05 දිනැති හා අංක 2304/87 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.10.26 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් ඇත්කඳුර, කොකරකන්ද, අංක 29/1 ලිපිනයෙහි පදිංචි වයි.ජයරත්න මහතා සහ 1. කොළඹ 02, වොක්ෂෝල් විදිය, අංක 305, එයිට්කන් ස්පෙන්ස් ටවර් 01, 9 වන මහල ලිපිනයෙහි පිහිටි ඇල්පිටිය ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී. 2. ඇත්කඳුර, දිවිතුර වතුයාය ලිපිනයෙහි පිහිටි ඇල්පිටිය ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී. අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/70/2022 හා 2025.09.29 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 නොවැම්බර් මස 17 වැනි දින.
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කොළඹ බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේ දී ය.

නඩු අංකය : A/70/2022
යොමු අංකය : IR/COM/03/2019/331

වයි. ජයරත්න මයා,
අංක 29/1,
කොකරකන්ද,
ඇත්කඳුර.

*පළමු පාර්ශ්වය*

*සහ*

**01.** ඇල්පිටිය ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී,
09 වන මහල,
එයිට්කන් ස්පෙන්ස් ටවර් 01,
අංක 305, වොක් ෂෝල් විදිය
කොළඹ 02.

**02.** ඇල්පිටිය ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී,
දිවිතුර වතුයාය,
ඇත්කඳුර.

*දෙවන පාශර්වය*

අතර පවතින කාර්මික ආරවුල.

**ප්‍රදානය**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා වෙත යොමු කර ඇත. ආරාවුල සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ යොමුව පහත පරිදි වේ.

"ඇල්පිටිය ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී සමාගමට අයත් ඇත්කඳුර දිවිතුර වතුයායේ සේවය කළ (2011.08.20 සිට 2018.11.15 දක්වා) වයි.ජයරත්න මහතාට දෛනික කම්කරු වැටුප ලබා දුන්නද, රියදුරු වැටුපට හිමිකමක් පවතින බවට කරන ඉල්ලීම අනුව රියදුරු වැටුප හිමි ද යන්නත් හිමි නම් ඔහුට ලැබිය යුතු සහන කවරේ ද, යන්නත් පිළිබඳවයි."

ඉල්ලුම්කරු වයි. ජයරත්න මහතා සහ ඇල්පිටිය ප්ලාන්ටේෂන් පී.එල්.සී ඇත් කඳුර දිවිතුර වතුයායේ ඇති කාර්මික ආරාවුල පිළිබඳව කම්කරු කොමසාරිස් ජනරාල්ගේ 2022.10.19 වන දින දරන අංක IR/COM/03/2019/331 දරන නියෝගය පරිදි ගරු කම්කරු අමාත්‍යතුමා විසින් සමාංක හා 2022.10.26 දිනැති නියෝගය ද කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ සමාංක හා 2022.10.21 දිනැති ලිපිය පරිදි මෙම ආරාවුල විසඳීම මෙහෙයවන ලදී.

| දිනය | වේලාව |
|---|---|
| 2022.11.17 | 11.00 |
| 2022.12.08 | 2.00 |
| 2023.01.05 | 2.00 |
| 2023.01.19 | 2.00 |
| 2023.03.23 | 3.00 |
| 2022.04.27 | 2.00 |
| 2023.06.08 | 2.00 |
| 2023.07.07 | 2.30 |
| 2023.09.01 | 2.00 |
| 2023.12.01 | 2.00 |
| 2024.01.04 | 2.30 |
| 2024.01.19 | 2.00 |
| 2024.02.26 | 11.30 |

2022.11.17 වන දින සිට නඩු වාර 13 ක් 2024.02.26 දින දක්වා පවත්වන ලදී. ඒ සඳහා දෙපාර්ශ්වය විසින් මූලික සාක්ෂි, හරස් ප්‍රශ්න හා ලිඛිත දේශන මගින් මෙම ආරාවුල වෙනුවෙන් සිය කරුණු ඉදිරිපත් කර ඇත. මෙහි දී ඉල්ලුම්කාර වයි. ජයරත්න මහතා පළමු පාර්ශ්වය වෙනුවෙන් නියෝජිත ග්‍රේෂන් සිල්වා මහතා ද, දෙවන පාර්ශ්වය වෙනුවෙන් ආයතනයේ නීතිඥ ෂෙහාරා කරුණාරත්න මහත්මිය සමග නීතිඥ මනෝලි ජිනදාස මහත්මිය ඉදිරිපත් වන ලදී.

මෙහි දී පලමු පාර්ශ්වය විසින් කර ඇති ඉල්ලීම වනුයේ සිය සේවා කාලයේ දී ඇල්පිටිය ප්ලාන්ටේෂන් පී.එල්.සී. ඇත්කඳුර දිවිතුර වතුයායේ සේවය කළ 2011.08.20 දින සිට 2018.11.15 දින දක්වා වූ කාලය තුළ දෛනික කම්කරු වැටුප් ලබා දුන්න ද, රියදුරු වැටුපට හිමිකම් පවතින බව තිරණය කොට රියදුරු වැටුප හිමිකර ගැනීම හා ඔහුට ලැබිය යුතු සහන ලබා ගැනීම සඳහා වේ.

මෙම බේරුම්කරණයේ දී වාචික හා ලිඛිත සාක්ෂි මෙන්ම එක් එක් ඉදිරිපත් කිරීම් වලට අදාළ වාර්තා ලිපි ද රාශියක් විමසුමට භාජනය කරන ලදී.

මෙම ඉල්ලුම්කරු දිවිතුර වතුයායේ සේවා කාලය 2011.08.01 දින සිට 2018.11.15 දක්වා වසර 07 ක් මාස 03 ක් හා දින 14 ක් ලෙස කරුණු ඉදිරිපත් කර ඇත. එසේම දෙවන පාර්ශ්වය විසින්ම එම සේවා කාලය පිළිගෙන ඇත. එසේම අවසන් වරට ගෙවා ඇති පාරිතෝශික මුදල් ගෙවන ලද හා ගණනය කරන ලද වාර්තාව වන 2018.11.16 දිනැති සේවක අර්ථ සාධක අංක 4389/ ජී 6808 දරන වාර්තා සටහන අනුව එකී කාලය නිවැරදි බව පිළිගත හැකි ය.

02. මෙම ඉල්ලුම්කරුගේ අංක 570752375V හා 2012.07.10 දිනැති හැඳුනුම්පත් අනුව මොහුගේ උපන් දිනය 1957.03.15 බව නිරීක්ෂණය වේ.

මෙම ඉල්ලුම්කරු වයි. ජයරත්න මහතා වෙත වතුයායේ රියදුරු තනතුරක රාජකාරි පවරා දිය යුතු බවට 2012.10.03 දිනැති වතු කළමණාකරු විසින් ලබා දී ඇති ලිපියෙන් තහවුරු වේ.

ඇල්පිටිය ප්ලාන්ටේෂන් පී.එල්.සී. හි දිවිතුරු වතුයායට අයත් වන "එයිට්කන් ස්පෙන්ස් සමාගමේ" සාමුහික ගිවිසුම පරිදි සේවා වර්ගීකරණය අනුව මේ සේවා ගණනයන් වර්ගීකරණය කර ඇත. මේ අනුව ජ්‍යෙෂ්ඨ මට්ටම/කණිෂ්ඨ මට්ටම හා අනෙකුත් සුළු සේවක මට්ටම ලෙස සේවා ගණ 03 කට වර්ගීකරණය කර ඇත. නඩත්තු හා සහය කාර්ය සේවා ගණයට රියදුරන් අයත් වේ. ඒ අනුව මාසික වැටුප් ලේඛනයට අතුළත් තනතුරක් ලෙස ස්ථාවර රියදුරු තනතුර ද චෙක්රොල් මගින් වැටුප් ගෙවන සේවකයින් කම්කරුවන් ලෙස ද වර්ගීකරණය කර ඇත.

මෙම ඉල්ලුම්කරු වැටුප් ලබා ගෙන ඇත්තේ චෙක්රොල් පදනමින් වන අතර රියදුරු රාජකාරි ලබා දී ඇති නමුත් කාර්ය මණ්ඩල වැටුප ලේඛනයන් වැටුප ලබා දී නැත.

මොහුගේ රියදුරු ලෙස සේවය ලබා ගෙන ඇති 2012.10.03 වන දින වන විට මොහුගේ වයස අවුරුදු 55 යි මාස 06 ක් හා දින 18 ක් වේ.

තව ද ලදුපත් අංක බී ටී 005284 හා 1982.06.12 දරන වාහන පැදවීමේ බලපත්‍රය අනුව මොහු ඒ පන්තියේ වාහන පැදවීමේ සුදුසුකම සපුරා ඇත.

මේ අනුව මොහු සේවයට බඳවා ගෙන ඇත්තේ වයස තිහකට සමාන රියදුරු අත්දැකීම් ඇති රියදුරුවෙකු ලෙස බවත් මින් නිරීක්ෂණය කෙරේ.

එසේම මෙම ඉල්ලුම්කරුවන්ගේ සේවය අවසන් කර ඇත්තේ 2018.11.15 වෙනි ලෙස ද වාර්තා අනුව නිරීක්ෂණය කෙරෙන අතර ඒ අනුව මොහු තමාගේ වයස අවුරුදු 55 සපුරා ලීමෙන් පසු තවත් එක් වසරකුත් මාස අටක පමණ සේවා කාලයක් සේවය කොට ඇත. ඒ අනුව මෙම සමාගම මොහුගේ සේවය අවසන් කර ඇත්තේ මොහුගේ වයස අවුරුදු 56 යි මාස අටකට පසු බව ද නිරීක්ෂණය වේ.

මෙම ඉල්ලුම්කරුගේ රියදුරු සේවාව ඉටු කරන විට නොයෙල් නැමති රියදුරෙකු වෙත රබර් කිරි එකතු කොට ගෙනවිත් භාර දිය යුතු බවත් සිය රාජකාරි පැවරීමේ ලිපියේ සඳහන් කර ඇත. (4.1) එමෙන්ම මෙම සමාගමේ ප්‍රධාන විධායක නිලධාරිගේ 2014.03.31 දිනැති පත්වීම් ලිපිය අනුව ජේ. නොයෙල් යන අය දිවිතුරු වතුයායේ ස්ථිර රියදුරකු ලෙස සේවය කරන බව ද තහවුරු වේ. ඒ අනුව නොයෙල් යන අය මෙම සමාගමේ රියදුරෙක් බව පිළිගැනේ.

ඒ අනුව මෙම ඉල්ලුම්කරුගේ ඉල්ලීම සම්බන්ධයෙන් තීරණයට අදාළ වන නිවැරදි සාධාරණ සාක්ෂිකරුවෙකු ලෙස ඔහුගේ සාක්ෂි ලබා ගැනීමට සුදුසු බවට තීරණය කරන ලදී. ඔහු සමාගමේ තවමත් ස්ථිර රියදුරු ලෙස සේවය කරන බැවින් වාචික සාක්ෂි ලබා දීමට ඔහු ඉදිරිපත් නොවීමත් දෙවන පාර්ශ්වය හරහා ඔහු සාක්ෂි දීමට කැඳවීම් කිරීමට තීරණය කළත් එම ඉදිරිපත් වීමද සිදු නොවුනි. එසේම නොයෙල් නැමති රියදුරකු සමාගම වෙත මෙයට සහභාගී විය නොහැකි බව ලිඛිතව ලබා දී ඇත. දිවිතුරු වතුයායේ ජ්‍යෙෂ්ඨ සාමාන්‍යාධිකාරි ඇමතූ 2023.09.20 දිනැති ජේ.නොයෙල් රියදුරුගේ ලිපිය පරිදි සාක්ෂි දීමට අකමැත්ත ප්‍රකාශ කිරීම ඔහුගේ සේවා සුරක්ෂිතතාවය පිණිස කරන ලද්දක් බවත් එම සාක්ෂිය ඉතා වැදගත් නමුත් නොසලකා හැරීම සුදුසු නොවන බවත් දෙවන පාර්ශ්වය විසින් ද තොරතුරු ඉදිරිපත් කර ඇත.

ඒ අනුව දෙවන පාර්ශ්වය වන පාලන අධිකාරිය විසින් මෙම කාර්ය සඳහා සාක්ෂිකරු ඉදිරිපත් නොකිරීම වැදගත් සාක්ෂියක් මගහැරීමක් පිළිබඳව සැලකිල්ලට ගන්නා ලදී.

එසේම මෙම ඉල්ලුම්කරුගේ ලිඛිත සාක්ෂි ලෙස ඉදිරිපත් කර ඇති පත්වීමේ ලිපිය/ධාවන සටහන්/ වැටුප් විස්තර/ පාරිතෝෂික ගෙවීම් හා උත්සව අත්තිකාරම අය කර ගැනීම වැනි වාර්තා අනුව මොහු රියදුරු ලෙස රාජකාරි කර තිබුණ ද චෙක්රොල් වැටුප් ලබන සේවකයෙක් ලෙස රියදුරු සේවය ඉටු කර ඇති බව ඔප්පු වී ඇත.

එසේම දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති ධාවන සටහන් එක් මාසයකට පමණක් බැවින් ඉදිරිපත් කළ විරෝධතා අනුව අදාළ වාහනයේ අදාළ කාල සීමාවේ ධාවන සටහන් සමාගම සතුව තිබිය යුතු වුව ද වසර ගණනාවක් පැරණි ලේඛන සොයා ගැනීමට නොහැකි බැවින් ඉදිරිපත් කර නැත. එබැවින් ද රියදුරු සේවය ලබා ගන්නා බවට ඉල්ලුම්කරු විසින් කරනු ලබන ඉල්ලීම ප්‍රතික්ෂේප කළ නොහැකි වී ඇත.

තව ද දෙවන පාර්ශ්වය විසින් පළමු පාර්ශ්වය වෙතින් ඉදිරිපත් කළ පුද්ගලයන් හතර දෙනෙකු දිවිතුරු වතුයායේ රියදුරන් බවට පිළිගනී. 2018 ජනවාරි සිට බන්දුල නිශාන්ත යන අයෙකු ස්ථිර රියදුරෙකු ලෙස සේවය කළ බව පිළිගෙන තිබුණ ද ඉදිරිපත් කර ඇති 2018 පෙබරවාරි මස වැටුප් ලේඛනයේ එවැනි අයෙකුගේ නම සඳහන් නොවන අතර එහි 1997 සිට සේවය කළ ජේ.නොයෙල් රියදුරු මහතාගේ නම පමණක් සඳහන්ව ඇත. ඒ අනුව බන්දුල නිශාන්ත නැමති අයට ද වෙනත් ලේඛනයකින් වැටුප් ලැබුණ රියදුරෙකු විය යුතු යැයි තීරණය කෙරේ.

මෙම ඉල්ලුම්කරු සේවය අවසන් කොට ආපසු ගෙවීමට තිබූ හිඟ උත්සව අත්තිකාරම් මුදල සමාගමට ආපසු ගෙවන ලද 14.12.2018 දිනැති රිසිට් පතෙහි මොහුගේ තනතුර රියදුරෙකු ලෙස සඳහන් වන අතර එම ලදුපත වතුඅධිකාරි විසින් නිකුත් කර ඇත.

මේ අනුව ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කර ඇති රාජකාරි පැවරීම 2012.10.03 වතු කළමනාකරුගේ ලිපියෙන් හා හිඟ මුදල් ගෙවන ලද 14.12.2018 දිනයෙහි වතුඅධිකාරි සතුව ඇති ලදුපත අනුව ද ඔහු රියදුරෙකු ලෙස සේවය කර ඇති බව පිළිගත හැකි ය.

එසේ වුව ද මොහු වෙත වැටුප් 2012.10.03 දින සිට සේවය අවසන් කර ඇති 2018.11.15 දින දක්වා මොහු එම සමාගම රියදුරෙකුගේ සේවය ලබා ගෙන ඇති බවත් නිරීක්ෂණය වේ.

තව ද මෙම නිරීක්ෂණයේ සාධාරණත්වය තිරණය කිරීමේ ප්‍රබලතම සාක්ෂියක් ලෙස සමාගමේ ස්ථිර රියදුරෙකු ලෙස සේවය කරන ජේ. නොයෙල් නමැති අයගේ සාක්ෂිය වැදගත් වන අතර ඒ සාක්ෂිය දෙවන පාර්ශ්වය ඉදිරිපත් නොකිරීම පිළිබඳව විනිශ්චය සභාව සෑහීමකට පත් නොවේ. එබැවින් එම තත්ත්වය ඉල්ලුම්කරුගේ ඉල්ලීම සාධාරණියකරණය කිරීමට හේතුවක් වී ඇත.

එලෙසම එම වතුයාය සතුව වාහන වලට රියදුරු තනතුරු කිහිපයක් තිබිය යුතු අතර ස්ථිර රියදුරු ලෙස සේවය ලබා ගෙන ඇත්තේ එක් රියදුරෙක්ගෙන් පමණක් වන අතර ඉතිරි අවශ්‍යතා කම්කරු සේවා සණයෙන් සපුරාගෙන ඇතැයි නිරීක්ෂණය කෙරේ.

එසේ රියදුරන් නොමැත්තේ නම් ක්ෂේත්‍රයේ විවිධ වූ සේවා කටයුතු සඳහා ආයතනය සතු එම වාහන යොදා ගන්නේ කෙසේ දැයි පැන නැගුණු ගැටළුවකි. එබැවින් එකී වාහන සේවයට යොදවා ගැනීම සඳහා ස්ථිර රියදුරෙක් වෙනුවට කම්කරු තනතුරු දරන සේවකයින් යොදා ගෙන කටයුතු කර ඇත. මෙම ඉල්ලුම්කරුගේ තමා විසින් 2017 ඔක්තෝබර් වැටුප් ලේඛනයේ නම සඳහන් කේ.ප්‍රකාෂ් යන අයට පසු කාලෙක 2020.06.03 දිනැතිව ස්ථිර රියදුරු පත්වීමක් ලබා දී ඇත. ඔහු ද කම්කරුවෙකු වශයෙන් සිටියද මීට පෙර රියදුරු සේවයේ යොදවා ගෙන තිබිය හැක.

මේ අනුව පුරප්පාඩු ස්ථාවර සපුරා නොකර ගනිමින් දෛනික වැටුප් ලබන සේවක පිරිස අතරින් රියදුරු සේවය ලබා ගෙන ඇති බව තිරණය කරන අතර එය සේවක පාර්ශ්වයෙන් ඔවුනට කෙරෙන අගතියක් වන බවත් ආයතනයේ මූලා තක්සේරුව හෝ ලාභදායි තත්ත්වයට පවත්වා ගෙන යාමට කරන ලද කාර්යක් ලෙස සැලකිය හැකිය. කෙසේ වෙතත් මෙලෙස අවශ්‍ය සුදුසුකම් සපුරා තිබිය දීත් වතුයායේ පුරප්පාඩු තිබිය දීත් කම්කරුවෙකු වෙත ස්ථිර පත්වීමක් නොදී රියදුරු සේවය ලබා ගැනීම අසාධාරණ තත්ත්වයක් බව තිරණය කෙරේ. මෙම ඉල්ලුම්කරු සිය රියදුරු ප්‍රවීණත්වය සහ සේවය දෛනික පඩි ලබමින් සලසා දී ඇති බව තිරණය කිරීමට පැමිණිලිකාර පාර්ශ්වයෙන් ඉදිරිපත් කළ හේතු සාධාරණ බව තිරණය කෙරෙන අතර දෙවන පාර්ශ්වය සිය ආයතනයේ ප්‍රාදේශීය වතු වල දෛනික සේවා කාර්යයන් ඉටු කර ගැනීමට ප්‍රායෝගිකව පවත්ව ගෙන යනු ලබන සේවක වරප්‍රසාද අහිමි වීමක් බවත් තිරණය කෙරේ.

මේ කරුණු සැලකිල්ලට ගෙන ඉල්ලුම්කරු වෙත එසේ අසාධාරණයක් සිදුව ඇතැයි නිගමනය කෙරේ.

ප්‍රදානය:

මේ අනුව පළමු පාර්ශ්වය වන ඉල්ලුම්කාර වයි. ජයරත්න මහතා දෛනික වැටුප් ගෙවීමට අයත් සේවා සණය යටතේ රියදුරු තනතුරක රාජකාරි කළ බවට තීරණය කෙරෙන අතර මොහු 2012 අගෝස්තු මස සිට කම්කරු වැටුප් ලබා ගෙන තිබුණ ද රියදුරුකු ලෙස ඔහුගේ මුළු සේවා කාලය 2012.10.03 දින සිට 2018.11.15 දින දක්වා වූ කාලය වන අවුරුදු 06 ක් මාස 01 ක් හා දින 12 ක් පමණ වනු ඇත.

මේ අනුව මෙම කාලය තුළ වෘත්තීමය රියදුරෙකු ලෙස රාජකාරි ඉටු කරමින් සිය සේවාව ආයතනය වෙත ලබා දී ඇති බැවින්, මෙම ඉල්ලුම්කරුට සේවා අනුව මූල්‍යමය අසාධාරණයක් සිදුව ඇති බව තීරණය කෙරේ.

එකී කාලයට මෙම ඉල්ලුම්කරු වෙත රියදුරු වැටුප් ගෙවිය යුතු බවත් එම කාලයට අදාළව පාරිතෝෂික මුදල් හිමිකම් උපයාගෙන ඇති බවත් ඒ හා සමාන වෙනත් වරප්‍රසාද ලබා දීම සුදුසු බවත් නිගමනය කෙරේ. එසේ වුව ද මෙම අයගේ සේවය ලබා ගත් වසර 06 ක් මාස 01 හා දින 12 ක කාලයට මෙම ඉල්ලුම්කරුට රියදුරු තනතුරට අදාළ වැටුප් ගණනය කෙරෙන්නේ නම් සාමූහික ගිවිසුම උපලේඛන පරිදි ස්ථිර රියදුරෙකුට හිමි වැටුප හා මොහු ලබා ගෙන ඇති වැටුප සැසඳිය යුතු ය.

ඒ අනුව ඉල්ලුම්කරු ඉදිරිපත් කර ඇති වැටුප් සහතික අනුව මසකට රු.22,000.00 රු.23,000.00ක් අතර ප්‍රමාණයක් ලබා ගෙන ඇති අතර ස්ථිර රියදුරෙකු ලෙස වැටුප් ලැබෙන්නේ නම් මසක වැටුප ලෙස මාසිකව රු.28,500.00ක් ලැබීමේ හිමිකම ලැබිය යුතුව ඇත. ඒ අනුව මාසිකව මුදලින් රු.5000.00 කට වැඩි ප්‍රමාණයක් මොහුට අහිමි වී ඇත.

මේ අනුව අවම වශයෙන් රු.360,000.00 ක (රුපියල් තුන් ලක්ෂ හැට දහසක) මුදලක් වැටුප වශයෙන් ද ඒ හා වැටුප් වර්ධක, නිවාඩු දින දීමනා අතිකාල දීමනා හා හිමි වරප්‍රසාද පිලිබඳව විමසීමේ දී මාසිකව තවත් මොහුට රු.1500.00 ක පමණ මූල්‍යමය අලාභයක් වී ඇති බව නිරීක්ෂණය කෙරේ. ඒ අනුව මුළු සේවා කාලයට රු.108,000.00 (රුපියල් එක් ලක්ෂ අට දහසක්) පමණ මුදල් ලැබිය යුතුව ඇත. තවද මෙම ගණනය කිරීම් මූලික වැටුප මත සලකා ගණන් බැලීම නිසා කිසියම් මූල්‍යමය පාඩුවක් සේවකයාට ද මූල්‍යමය වාසියක් ආයතනයට ලැබිය හැකි අතර මෙම මුදල් ප්‍රදානයේදී ගෙවීමේ දී මූලිකවම මූලික වැටුප් පදනම් කොට ගණනය කිරීම කර ඇත.

එසේම වාර්ෂික පාරිතෝෂික දීමනාව අනුව ද මේ කාලයට අදාළව එම මුදලද රු.60,000.00 (රුපියල් හැටදහසක්) පමණ මුදලක් අහිමි වී තිබේ.  මේ අනුව සාමාන්‍යයෙන් රු.528,000.00 ක (රුපියල් පන්ලක්ෂ විසි අට දහසක්) මුදලක් මොහුට හිමි විය යුතුව ඇති බවට ගණනය කරනු ලැබේ.

එබැවින් මෙම ඉල්ලුම්කරු වෙත සිදු වී ඇති අසාධාරණය වෙනුවෙන් දෙවන පාර්ශ්වය වන වතු සමාගම මගින් මෙම මුදල ගෙවිය යුතු බව තිරණය කරමි.

ඒ අනුව රු.528,000.00 ක (රුපියල් පන්ලක්ෂ විසිඅට දහසක) මුදලක් මෙම ප්‍රදානය *ගැසට්* ගත කිරීමෙන් මසක් ඇතුලත දකුණු කොළඹ සහකාර කම්කරු කොමසාරිස් කාර්යාලය වෙත තැන්පත් කරන මෙන් ද වගඋත්තරකාර ඇල්පිටිය ප්ලාන්ටේෂන් පී ල් සී සමාගම වෙත නියෝග කරමි.

මෙම ප්‍රදානය සාධාරණ සහ යුක්ති සහගත ප්‍රදානයක් බව ප්‍රකාශ කරමි. තවද ව්‍යවස්ථාපිත හිමිකම් අයදුම් කිරීමට මෙම ප්‍රදානය බාධාවක් නොවේ.

**සරත් චන්ද්‍රසිරි විතාන,**
බේරුම්කරු,

2025 සැප්තැම්බර් මස 29 වැනි දින,

EOG 12 - 0047

මගේ අංකය: IR/COM/04/2019/220

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2024.02.17 දිනැති හා අංක 2371/60 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2024.02.07 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් අන්නාසිවතුගොඩ, අන්නාසිවතුගොඩ පාර, දූවේ වත්ත, අංක 388/3/බී ලිපිනයෙහි පදිංචි ජී.එස්.ආර්.ප්‍රනාන්දු මයා සහ කොළඹ 15, රොක්හවුස් පටුමඟ ලිපිනයෙහි පිහිටි ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/05/2024 හා 2025.10.21 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 නොවැම්බර් මස 18 වැනි දින.
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේ දී ය.

බේරුම්කරු : අහමඩ් ලෙබ්බේ මොහොමඩ් සලිම් මහතා ඉදිරිපිට දී ය
ගොනු අංකය : IR/COM/04/2019/220
බේරුම්කරණ නඩු අංකය : A/05/2024

ජී. එස්. ආර්. ප්‍රනාන්දු මයා,
අංක 388/3/බී,
දූවේ වත්ත,
අන්නාසිවතුගොඩ පාර,
අන්නාසිවතුගොඩ.

*පළමු පාර්ශ්වය*

*සහ*

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව,
රොක්හවුස් පටුමග,
කොළඹ 15.

*දෙවන පාර්ශ්වය*

අතර පවතින කාර්මික ආරාවුල.

**බලතල පැවරීම**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර වන මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය ) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් රාජගිරිය, ඔබේසේකරපුර, ඇසළ උද්‍යාන පාර, අංක 46/7 දරන ලිපිනයේ පදිංචි අහමඩ් ලෙබ්බේ මොහෙමඩ් සලීම් වන මා පත්කර ඇත.

**යොමුව**

“ ජී. එස්. ආර්. ප්‍රනාන්දු මහතාට ජොෂ්ඨ ආරක්ෂක පරීක්ෂක තනතුර නොලැබීමෙන් අසාධාරණයක් සිදු වී තිබේ ද එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමි විය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ.”

මෙම නඩුවේ පළමු පාර්ශ්වකරු වන ජී.එස්.ආර්.ප්‍රනාන්දු මහතා වෙනුවෙන් එම්. කේ. හේමපාල මහතා පෙනී සිටින ලදී. දෙවන පාර්ශ්වය වෙනුවෙන් ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ නීති නිලධාරි වන එස්. ඒ. නයනා කුමාරි කරුණාරත්න මහත්මිය සහ සහකාර මානව සම්පත් කළමනාකාරි පූර්ණි මනුප්‍රියා ජයවර්ධන මහත්මිය සමග කළමනාකරණ සහකාර නදීකා රාජපිටිය මහත්මිය ද පෙනී සිටින ලදී.

මෙම නඩුව මීට පෙර 2021.11.29 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශයේ සඳහන් කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නීතිඥ එල්. ඒ. ප්‍රියන්ති ලියනාරච්චි මහත්මිය වෙත යොමු කරන ලදි. එම බේරුම්කරු නීතිඥ එල්. ඒ. ප්‍රියන්ති ලියනාආරච්චි මහත්මිය බේරුම්කරණයෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කර මා පත්කරන ලදි. ඒ අනුව 2024.03.19, 2024.05.13, 2024.07.24, 2024.08.05, 2024.09.09, 2024.11.25, 2025.01.06, 2025.02.17, 2025.04.07, 2025.04.28 ,2025.06.09 වන දිනයන් හී විභාගය පවත්වා ඇත. මීට අමතරව ලිඛිත දේශන පළමු පාර්ශ්වය විසින් 2025.06.16 වන දිනත් දෙවන පාර්ශ්වය විසින් 2025.06.17 වන දිනයන් හි ගොනු කර ඇත.

මෙම නඩුව පළමු වරට 2024.03.19 වන දින කැඳවන ලද අතර දෙවන පාර්ශ්ව ආයතනය වෙනුවෙන් සැලකර සිටියේ මෙම නඩුව මුලින් කැඳවා විභාග කරන ලද නඩුවක් බැවින් එතැන් සිට විභාග කර මෙම නඩුව අවසන් කරන ලෙසත්ය. එසේ වුවත් ඒ සඳහා පළමු පාර්ශ්වය කැමැත්ත ප්‍රකාශ නොකර සිටින ලද අතර මෙම නඩුව නැවත මුල සිට විභාගය පවත්වන ලෙස ඉල්ලා සිටින ලදි.

ඒ අනුව 2024.05.13 වන දින පළමු පාර්ශ්වයේ නියෝජිත මහතා විසින් පළමු පාර්ශ්වකරුගේ මූලික සාක්ෂි විමසීම එදින ආරම්භ කරන ලදි. පළමු පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද කරුණු අනුව ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ ආරක්ෂක කටයුතු භාරව පැවැති "ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ ආරක්ෂක ව්‍යාපෘතිය යටතේ ඉල්ලුම්කරු වන ජී. එස්. ආර්. ප්‍රනාන්දු මහතා 1996 සිට කණිෂ්ඨ සහ ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි ලෙස කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවා ගන්නා ලදි. පළමු පාර්ශ්වකරු වන ජී. එස්. ආර්.ප්‍රනාන්දු මහතා තරඟ විභාගයේ ප්‍රතිඵල පදනම් කරගෙන 1997.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි දෙවන පාර්ශ්ව ආයතනය වන ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි ලෙස ස්ථිර සේවයට පත්කර ඇත." උසස්වීම් නොලබා වසර 11 කට වැඩි කාලයක් ගත වූ පසු සේවක දුක් ගැනවිලි කමිටු නිර්දේශ මත ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි තනතුරේ සේවය කළ පළමු පාර්ශ්වයට මුල්වරට 2008 වසරේ උසස්වීමක් ලෙස ආරක්ෂක පරීක්ෂක III වන ශ්‍රේණිය ලබාදී ඇති අතර 1997.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි ලෙස සේවය කරමින් සිටි එච්. සුනන්ද පෙරේරා, එච්. සී. මහින්ද සේන, ඩබ්. සී. කල්‍යානප්‍රිය යන තිදෙනාට අත්තනෝමතික ලෙස ආරක්ෂක පරීක්ෂක I ශ්‍රේණිය ලබා දී ඇති බවත් කියා සිටින ලදි.

දෙවන පාර්ශ්ව ආයතනය වන ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව වෙනුවෙන් ඉදිරිපත් කළ කරුණු අනුව පළමු පාර්ශ්වකරු වන ජී. එස්. ආර්. ප්‍රනාන්දු මහතා 1996.02.13 දින සිට මාස 6 ක කාලයට කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවා ගන්නා ලද අතර 1996.03.08 වන දින සිට ජ්‍යෙෂ්ඨ ආරක්ෂක පරීක්ෂක තනතුරට පත්කර ඇත. ඉල්ලුම්කරු ආයතනය මඟින් ලබා දෙන පුහුණුවකින් පසුව තරඟ විභාගයක් පවත්වා ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි ලෙස 1997.01.01 දින සිට එම තනතුරේ ස්ථිර කර ඇත. 2008 වසරේ පැවැති සේවක දුක්ගැනවිලි කමිටුවේ නිර්දේශ මත ආරක්ෂක පරීක්ෂක III වන ශ්‍රේණියට උසස් කර ඇති බවත්, වසර 5 ක සේවා කාලය සලකා බලා 2013.06.01 දින සිට ආරක්ෂක පරීක්ෂක II වන ශ්‍රේණියට පත් කර ඇත. නමුත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2018.04.26 වන දින අනුමත කරන ලද බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අනුව වසර 5 න් 5 ට පැවැති උසස්වීම් ලබාදීමේ ක්‍රම වේදය වසර 10 න් 10 ලෙස සංශෝධනය වූ බවට දෙවන පාර්ශ්වය කියා සිටී. ඒ අනුව පළමු පාර්ශ්ව ඉල්ලුම්කරුට වසර 10 සම්පූර්ණ වන්නේ 2023.06.01 දින වුවත් පළමු පාර්ශ්ව ඉල්ලුම්කරු වසර 60 සම්පූර්ණ වී 2019.07.06 දින විශ්‍රාම ගිය බව දෙවන පාර්ශ්වය ප්‍රකාශ කර සිටී. අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියට අනුව පළමු පාර්ශ්වකරුට උසස්වීමක් ලබාදීමට නොහැකි බවට ප්‍රකාශ කරන ලදි.

තවද දෙවන පාර්ශ්වය ප්‍රකාශ කරන ලද්දේ පළමු පාර්ශ්වකරු ආරක්ෂක නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමට පැවැති 6 වන තරඟ විභාගයේ දී ලකුණු 276 ක් ලබා 3 වන ස්ථානය ලබා ගෙන ඇති අතර එම විභාගයෙන්ම ලකුණු 292 ක් ලබාගනිමින් ඩී. ඩී. ඒ. වික්‍රමරත්න මහතා පළමු වන ස්ථානයට පත්ව ඇති බවට කරුණු ඉදිරිපත් කර ඇත. (ලකුණු ලබාදීමේ ලේඛනය R -4 ලෙස ඉදිරිපත් කර ඇත) ඒ අනුව ඩී. ඩී. ඒ. වික්‍රමරත්න මහතාට 1997.01.01 දින සිට ස්ථිර පත්වීම් ලබාදී ඇත (R -5 A ලෙස ලේඛනය ලකුණු කර ඇත) එසේම එම මහතා ට 2008.06.01 දින සිට සේවක දුක්ගැනවිලි කමිටු නිර්දේශ මත ආරක්ෂක පරීක්ෂක III වන ශ්‍රේණිය ලබාදී ඇත. ඉන්පසුව 2013.06.01 දින සිට ආරක්ෂක පරීක්ෂක II ශ්‍රේණිය ලබා දී ඇත.

එ අනුව 2013.06.01 දින සිට පළමු වන පාර්ශ්වයේ ඉල්ලුම්කරු ආරක්ෂක පරීක්ෂක II වන ශ්‍රේණියේ තනතුරට පත්කර ඇති අතර (එම ලේඛනය R -8, R -9 ලෙස සලකුණු කර ඇත.) ඔහු සමග එකම දින සිට සේවයට බැඳුණු ඩී. ඩී. ඒ. වික්‍රමරත්න යන අය ද 2013.06.01 දින සිට ආරක්ෂක පරීක්ෂක II ශ්‍රේණිය තනතුරට පත්කර ඇති බවට දෙවන පාර්ශ්ය කරුණු ඉදිරිපත් කර ඇත.

**නිරීක්ෂණ සහ නිගමන**

ඉහත කරුණු සලකා බලන විට දෙවෙනි පාර්ශ්ව ආයතනය වන ලංකා ධීවර වරාය නීතිගතසංස්ථාව විසින් ඉදිරිපත් කරන ලද කරුණු සියල්ල සාක්ෂි කැඳවීමේ දි හා ලේඛන මගින් ද පළමු පාර්ශ්වකරු පිළිගෙන ඇත. දෙවන පාර්ශ්ව ආයතනය විසින් ඉදිරිපත් කරන ලද ලකුණු සටහන සංසන්දනය කර බැලීමේ දී පිළිවෙලින් පළමු බඳවා ගැනීමේ තරහ විභාග ප්‍රතිඵල අනුව දෙවන වැඩිම ලකුණු ලබාගත් එන්. ඩබ්. එස්. එස්. පෙරේරා මහතාත්, දෙවන බඳවා ගැනීමේ දී වැඩිම ලකුණු ලබාගත් ඩබ්. පී. කල්‍යානප්‍රිය මහතාටත්, තුන්වන බඳවා ගැනීමේ දී දෙවෙනියට ලකුණු ලබාගත් එච්. වී. මහින්ද සේන මහතා ද හයවන තරහ විභාගයෙ දී ඉල්ලුම්කරු සහ ඩී. ඩී. ඒ. වික්‍රමරත්න මහතාට ද ලකුණු සටහන අනුව ස්ථිර පත්වීම් ලබාදී ඇත.

පළමු පාර්ශ්වකරු වන ඉල්ලුම්කරුගේ පත්වීම් ලිපිය අනුව (R -3 ලේඛනය) සහ ඩී. ඩී. ඒ. වික්‍රමරත්න යන මහතාගේ පත්වීම් ලිපිය අනුව (R-5 ලේඛනය) එකම දිනයක එකම තනතුරක එකම සේවයේ ස්ථිර කර උසස්වීම් ලබා දී ඇති බව තහවුරු වේ.

X -1 ලකුණු කරන ලද ලේඛන අනුව 2008 වසරේ සේවක දුක්ගැනවිලි කමිටුවේ ආරක්ෂක පරීක්ෂක I,II,III ශ්‍රේණි ලෙස ලබාදී ඇති සේවක තොරතුරු විස්තර අනුව 2008.06.01 දින සිට පළමු පාර්ශ්වකරු වන ජී. එස්. ආර්. ප්‍රනාන්දු යන අයට (R- 8) සහ ඩී. ඩී. ඒ. වික්‍රමරත්න මහතාට (R -9) ආරක්ෂක පරීක්ෂක III වන ශ්‍රේණිය ලබාදී ඇත.

එසේම 2013.06.01 දින සිට පළමු පාර්ශවකරු ආරක්ෂක පරීක්ෂක II වන ශ්‍රේණියට පත්කර ඇති අතර එකම දිනයේ සේවයට බැඳුන ඩී. ඩී. ඒ. වික්‍රමරත්න මහතාට ද 2013.06.01 දින සිට ආරක්ෂක පරීක්ෂක II ශ්‍රේණිය තනතුරට පත්කර එකම වැටුප් තලයේ පිහිටුවා ඇත. ඒ අනුව බලන විට පළ පාර්ශ්වකරු වන ඉල්ලුම්කරුට අසාධාරණයක් සිදුව ඇත යන තර්කය පිළිගත නොහැක.

**ප්‍රදානය**

ඒ අනුව යොමුවේ සඳහන් ආකාරයට පළමු පාර්ශ්වකරු විසින් ඉල්ලා සිටින ජ්‍යෙෂ්ඨ ආරක්ෂක පරීක්ෂක තනතුර සඳහා දෙපාර්ශ්වය විසින්ම ඉදිරිපත් කරන ලද ලේඛන වලින් පැහැදිලි වන්නේ පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරුට අසාධාරණයක් සිදුවී නොමැති බවයි. ඒ අනුව 2018.06.01 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කරන ලද බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියට අනුව වසර 10 ක් සම්පූර්ණ නොවී, ඊට පෙර 2019.07.06 වන දින වන විට පළමු පාර්ශ්වකරු විශ්‍රාම ගොස් ඇති නිසා ආරක්ෂක පරීක්ෂක 1 වන ශ්‍රේණියට උසස්වීමට තිබූ අවස්ථාව ද අහිමි වී ඇති බැවින් පළමු පාර්ශ්වකරු වන ජේ.එස්.ආර්. ප්‍රනාන්දු මහතාට ජ්‍යෙෂ්ඨ ආරක්ෂක පරීක්ෂක තනතුර නොලැබීමෙන් අසාධාරණයක් සිදුව නැති බවට තීරණය කරමි.

ඒ අනුව මෙම ප්‍රදානය සාධාරණ සහ යුක්ති සහගත ප්‍රදානයක් බවට සහතික කරමි.

**අහමඩ් ලෙබ්බෙ මොහොමඩ් සලීම්,**
බේරුම්කරු,

2025 ඔක්තෝබර් මස 21 වැනි දින,

EOG 12 - 0048